**<u>මොනරාගල ප්‍රාදේශීය සභාව</u>**

**<u>2022.09.16 දින මහ සභා වාර්තාව</u>**

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ පනස් හතරවන (54) සභා වාරය 2022.09.16 වන දින ප.ව 2.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**<u>පැමිණීම</u>**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී.චාමර නානායක්කාර මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයජීලන් මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා නුරුද්ධිකාරත්නායක මැතිතුමිය |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුලකුමාරසිරි මැතිතුමා |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණී මැතිතුමිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| | | |
| සභා ලේකම් | - | ඩී.එම්.අනුර දිසානායක මහතා |

**<u>නොපැමිණීම</u> - නැත**

**<u>පිළිගැනීම</u>**

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**01.පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.**

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ  සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදි.

එහිදී සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පසු ගිය මස මහ සභා වාර්තාව සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන්ගේ සහ ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාවේ ඒකමතික එකඟතාවයෙන්  සභා සම්මත කරන ලදි.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**03.සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම.**

නැත

**04.යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම**

නැත

**05.යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම**

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

**05.1.ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**යෝජනා අංක 01**

2022 වර්ෂයේ මාර්තු මස සාද නිවාස පාර කාපට් කිරීමට ආරම්භ කළද රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් එම සංවර්ධන කටයුතු තාවකාලිකව නවතා දමා ඇති බැවින් මේ වන විට පා ගමනින්වත් ගමන් කිරීමට නොහැකි තරම් ඉතා අබලන් තත්ත්වයට පත්ව ඇති මෙම මාර්ගය භාවිත කරන පවුල් 100ක පමණ වරිපනම් බදු ගෙවන ජනතාවක් ඉතාමත් අසරණ තත්ත්වයකට මුහුණ දී ඇති බව සිරිවිජය සුභ සාධක මිතුරු සංසදය විසින් දැනුම් දී ඇති බැවින් සභා අරමුදලින් මෙම මාර්ගය සකස් කර දීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදි.`අනතුරුව පයින්වත් ගමන් කිරීමට නොහැකි තරමට මෙම මාර්ගය අබලන් වී ඇති බැවින්

හදිසි රෝගියෙක්වත් රෝහල වෙත ගෙන යාමට අපහසු තත්ත්වයන්ද පවතින බැවින් ඉතා කඩිනමින් මෙම මාර්ගය සකස් කර දීම සුදුසු බව ගරු මන්ත්‍රී තුමා තව දුරටත් සඳහන් කර සිටින ලදි.

ශෂීන්ද්‍ර රාජපක්ෂ ගරු අමාත්‍යතුමන් පසුගිය දිනක මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වැඩ ආරම්භ කලද රටේ ඇති වූ තත්ත්වයත් සමග එහි සංවර්ධන කටයුතු නැවතී ඇති බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින් ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් මහ සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරි මහතෙකු යොදවා මෙම මාර්ගය පරීක්ෂාකර බලා නිර්දේශ සහිත වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව මෙම මාර්ගයේ අබලන් ස්ථානවලට ග්‍රැවල් දමා සකස් කර දී ම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 02**

මොනරාගල ජල සම්පාදන මණ්ඩලයට අයත් ජල ටැංකිය අසල කුමාරදොල මාර්ගය හී පදිංචි පී.ජයවතී මිය විසින් කුමාරදොල මාර්ගයේ ජල ටැංකිය අසලින් දකුණු පැත්තට ඇති අතුරු මාර්ගයට මාටින් මාවත නමින් නම් කර එම නාමය ඇතුලත් කොට නාම පුවරුවක් ප්‍රදර්ශණය කිරීමට අවසර දෙන ලෙස කර ඇති ඉල්ලීම සඳහා සහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයජීලන් ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී සභාවෙන් කළ විමසීම් වලට අනුව මෙම නාම පුවරුවට ඇතුලත් කිරීමට ඉදිරිපත් කර ඇති නාමය සඳහන් පුද්ගලයා මේ වන විට ජීවතුන් අතර නොමැති අතර එසේ මිය ගිය පුද්ගලයෙකුගේ නාමයක් ඇතුලත් කොට මේ ආකාරයේ නාම පුවරුවක් ප්‍රසිද්ධ කිරීමට සභාවෙන් අවසර ලබා දිය හැකි බව ගරු සභාපතිතුමන් සඳහන් කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභා බලතල වලට යටත්ව මෙම මාර්ගයේ පදිංචි බහුතරයකගේ කැමැත්ත මේ සම්බන්ධයෙන් පවතිනවාද යන්න තහවුරු කර ගැනීම සඳහා අත්සන් ලේඛනයක්ද ලබා ගැනීමෙන් අනතුරුව මෙම මාර්ගයට **මාටින් මාවත** යන නාම පුවරුවක් ප්‍රදර්ශනය කර ගැනීමට සභාවේ අවසරය ලබා දීම සුදුසු බවත්, එය ප්‍රදේශයේ දැන ගත යුතු නිලධාරීන් වෙත දන්වා යැවීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී .

**යොජනා අංක 03**

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු කළ ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති දොඩම්වත්ත, කුමාරපුර හා අක්කර 25 බල ප්‍රදේශයේ ඇතුලත් කළාපයට අදාළ සිතියම සඳහා සභා තීරණය සහ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට රමණී රත්නායක ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

සමීක්ෂණයක් සිදු කර ඒ අනුව සකස් කර ඇති මෙම ප්‍රදේශය ඇතුලත් සිතියම මේ වන විට සියලුම මන්ත්‍රීවරුන් වෙත ලබාදී ඇති බැවින් ඒ අනුව සාකච්ඡා කර සභා තීරණයක් ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා සභාවට දැනුම් දෙන ලද අතර මෙම ප්‍රදේශයේ ජීවත් වන්නන්ද මේ සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බවට තමන් වෙත දන්වා ඇති බව ද ගරු සභාපතිතුමන් සභාවට දන්වා සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු කළ ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති දොඩම්වත්ත, කුමාරපුර හා අක්කර 25 බල ප්‍රදේශයේ ඇතුලත් කළාපයට අදාළව සකස් කර ඇති සිතියම පිළිගැනීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 04**

මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදනතම පළාත් පාලන ආයතනයක් වශයෙන් මොනරාගල ප්‍රාදේශීය සභා ආයතනය සඳහා සියලු පහසුකම් සහිත දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ඇති අතර, කාර්යාල භූමිය තුල අඩුපාඩුවක්ව පවතින අංග සම්පූර්ණ බුදු මැදුරක් ආධාර හා පරිත්‍යාග මගින් ඉදිකිරීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ බොහෝ වේලාවක් සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉතාමත් වැදගත් යෝජනාවක් වන බැවින් කාර්මික නිලධාරී මහතාගේ නිසි අධීක්ෂණයන් යටතේ විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සහා කාර්යාල පරිශ්‍රයේ තෝරාගත් සුදුසු ස්ථානයක හැකි අයුරින් බුදු මැදුරක් ඉදිකිරීම සුදුසු බවත්,මේ සඳහා ආධාර උපකාරයන් ලබා ගැනිමේදී කිසිම ගැටලු සහගත ත්ත්වයක් ඇති නොවන ආකාරයටත්, සභාවට හානියක් නොවන ආකාරයටත් ඒ කටයුතු ක්‍රමානුකූලව මැනවින් සිදු කර ගැනීමට කටයුතු කළ යුතු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 05**

මොණරාගල ප්‍රාදේශිය සභාව සඳහා සේවා පහසුකම් ලබා ගැනීමට පැමිණෙන සේවා ලාභී සියලු ජනතාව සඳහා වැසිකිලි හා කැසිකිලි පහසුකම් ලබා දීම සඳහා මේ වනවිට කාර්යාලය ඇතුලත ඉදිකර ඇති නිලධාරීන් විසින් භාවිතා කරන වැසිකිලි පද්ධතිය භාවිතා කරන අතර, කාර්යාල පරිශ්‍රයේ සුදුසු වෙනත් ස්ථානයක පිටතින් පැමිණෙන ජනතාව වෙනුවෙන් වැසිකිලි පද්ධතියක් සහා අරමුදලින් ඉදිකිරීම සඳහා  සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ බොහෝ වේලාවක් සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම යෝජනාවද කාලීන වශයෙන් ඉතාමත් වැදගත් යෝජනාවක් වන බැවින් කාර්මික නිලධාරී මහතාගේ නිසි අධීක්ෂණයන් යටතේ විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සහා කාර්යාල පරිශ්‍රයේ තෝරාගත් සුදුසු ස්ථානයක හැකි අයුරින් සේවා ලාභී සියලු ජනතාව සඳහා වැසිකිළි හා කැසිකිළි පහසුකම් ලබා දීමට අවශ්‍ය වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සහා අරමුදලින් විධිමත් කුමවේදයන්ට යටත්ව  සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි. තවද මෙහි ආබාධිත ප්‍රජාවගේ පරිහරණයට ගත හැකි අයුරින්ද කොටසක් වෙනම සකස් කිරීමට මේ සමඟම සිදු කිරීම සුදුසු බවද සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 06**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළඳපොලේ අංක 03 දරණ ගව මස් වෙළඳසැල දීර්ඝ කාලයක සිට ටෙන්ඩර් මගින් ලබාගෙන පවත්වාගෙන යන අතර, 2019 සිට 2022 වර්ෂය දක්වා රටේ පැවති කොරෝණා වසංගතය හා ඉන්ධන අර්බුදය මත වුවද ප්‍රාදේශීය සභාවට ගෙවීමට තිබූ බදු මුදල් නිවැරදිව ගෙවා ගෙන ගිය අතර 2023 වර්ෂය වෙනුවෙන් දැනට 2022 වර්ෂයට ලබා දී ඇති ටෙන්ඩර් මුදලින් 5%ක මුදලක් වැඩි කර ටෙන්ඩර් නොකර ලබා දෙන ලෙස ගව මස් වෙළඳසැල භාර ගෙන ඇති බදු කරු වන එම්.එස්.එම්.නිෂාම් මහතා විසින් කර ඇති ඉල්ලීම සඳහා සභා  අනුමැතිය ලබා දීම සුදුසු බවට මහා සභාවේ සභා තීරණය හා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මේ සම්බන්ධයෙන් සභාවේ දීර්ඝ වශයෙන් සාකච්ඡාවට බඳුන් වූ අතර අතුල කුමාරසිරි ගරු මන්ත්‍රී තුමාත්, පී බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාත්, වයි.උපුල් ගරු මන්ත්‍රීතුමාත් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වා සිටි අතර දිගින් දිගටම එක් අයෙකුට මෙය ලබා දීම ටෙන්ඩර් ක්‍රමවේදයට පටහැනිව කටයුතු කිරීමක් වන බැවින සහා නීති රීති වලට අනුව ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කර මෙම ගව මස් වෙළඳසැල 2023 වර්ෂයට ටෙන්ඩර් කර ලබාදීම සුදුසු බවට අදහස් දක්වා සිටින ලදී.

එහිදී සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමාත්, ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමාත් මෙය ටෙන්ඩර් කර ලබා දීමේදී ඕනෑම කෙනෙකුට එය ඉල්ලුම් කළ හැකි වන අතර එසේ ටෙන්ඩරය ලබා ගන්නා කෙනාට බල ප්‍රදේශය තුළම ගව ඝාතකාගාර පහසුකම් ද අනිවාර්යයෙන්ම ලබා දීමට සිදුවන බවත්, මීට පෙර කාලවලදී මේ ආකාරයෙන් ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් ගවමස් කඩය ලබාදීම තුල කුඹුක්කන ප්‍රදේශයෙන් ගව ඝාතකාගාරයක් ද ලබා දීමට සිදු වූ අතර එහිදී කිසිම සීමාවකින් තොරව ඉතාමත් බිහිසුණු ආකාරයට ප්‍රදේශයෙන් සෑම ස්ථානයකම හොර රහසේම හරක් මරා ඒවායෙන් ඉවත ලන කොටස් ද නොයෙක් නොයෙක් අයගේ ඉඩම් වලද ප්‍රදේශයේ ප්‍රධාන ගංගා වලටද ගෙනගොස් දැමීම තුළ විශාල ගැටලුවලට සභාවට මුහුණ පෑමට සිදු වූ බවත් විශේෂයෙන්ම කලට වේලාවට බදු බදුකුලී ගෙවීම් නොකර නඩු හබ වලට පවා යාමට ද සිදු වූ බවට අදහස් ප්‍රකාශ කර සිටින ලදි.

එහිදී නැවත ගරු උප සභාපතිතුමාත්, සනත් ගුණවර්ධන මන්ත්‍රීතුමාත්, චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමාත්, විසින් නීත්‍යානුකූලව මෙය ටෙන්ඩර් කර ලබාදිය යුතු ක්‍රමවේදය වුවත්, පෙර කාලවල දී එසේ කිරීම තුළ මේ ආකාරයේ විශාල ප්‍රශ්න රාශියකට ප්‍රාදේශීය සභාවට මුහුණදීමට සිදුවූ අතර ඉදිරියේ දී ගව මස් වෙළඳසැල ටෙන්ඩර් කර ලබා දීම තුළදී අනිවාර්යෙන්ම ගව ඝාතකාගාර පහසුකම්ද සැපයීමට ප්‍රාදේශීය සභාවට සිදුවන අතර ඒ අනුව වර්තමානයේ රටේ පවතින තත්ත්වයත් සමග විශාල ප්‍රශ්න රාශියකට ප්‍රාදේශීය සභාවට මුහුණ දීමට සිදු වනවා මෙන්ම දැඩි දෝෂ දර්ශනයට ද ලක් වන අතර මෙය ටෙන්ඩර් කර ලබාදිය යුතු බවට ප්‍රකාශ කරන මන්ත්‍රීවරුන් විසින් එහි වගකීම බාර ගත යුතු බවටත් කරුණු කාරනා පැහැදිලි කර සිටින ලදි.

එහිදී නැවත සුනිල් අරංගල ගරු මන්ත්‍රී තුමන් විසින් කියා සිටියේ කුඹුක්කන ප්‍රදේශයේ නැවත ගව ඝාතකාගාරයක් ආරම්භ කිරීමට තමන් කිසිසේත්ම ඉඩ නොදෙන බවයි.

අනතුරුව මෙම ඉල්ලුම්කරු විසින් ඉතාමත් සාමකාමී ව කලට වෙලාවට බදු මුදල් ගෙවමින් ප්‍රාදේශීය සභාවට කිසිම දෝෂ දර්ශනයකට ලක් නොවන ආකාරයට තම වෙළඳාම් කටයුතු සිදු කර ගෙන යන අතර ගව ඝාතාකාගාර පවත්වාගෙන යනු ලබන පිට ප්‍රදේශවලින් මස් ගෙනැවිත් මෙම ගව මස් වෙළඳසැල මෙතෙක් පවත්වාගෙන ගිය බැවින් ඔහුට ම මෙය ඉදිරි වර්ෂයටත් ටෙන්ඩර් නොකර ලබා දීම සුදුසු බවට සභාවේ බහුතර දෙනා අදහස් දක්වා සිටින ලදී.

මෙය නැවත සභාවේ දීර්ඝ වශයෙන් සාකච්ඡා වූ අතර විරෝධතා කිසිවක් දිගින් දිගට ඉදිරිපත් නොවූ බැවින් ප්‍රදේශයේ ගව ඝාතකාගාරයක් ආරම්භ කිරීම සුදුසු තත්ත්වයක් නොවන බැවින් මෙය මෙතෙක් කර ගෙන ආ බදු කරු වෙතම 2023 වර්ෂයටත් ලබා දෙනවානම් රටේ පවතින තත්ත්වයත් සමඟ සෑම අංශයකම මිල ඉහළ ගිහින් ඇති බැවින් ඔහුගේ ඉල්ලීම පරිදි 2022 වර්ෂයේ බදු මුදලට 5% ක් වැඩි කර ලබා දීම වෙනුවට 10% ක් වැඩි කර ලබා දීම සුදුසු බවට අජිත් අගලකඩ ගරු මන්ත්‍රීතුමා යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට පී බණ්ඩාර ගරු මන්ත්‍රී තුමන් විසින් ස්ථිර කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉදිරිපත් වූ කරුණු කාරණාත් සමඟ ප්‍රාදේශීය සභාවට අයත් ගව මස් වෙළඳසැල ටෙන්ඩර් කර ලබා දීම තුළ ප්‍රදේශයේ ගව ඝාතකාගාරයක් ආරම්භ කිරීමට අවස්ථාවක් දීම සුදුසු තත්ත්වයක් නොවන බැවින් 2023 වර්ෂයට ගව මස් වෙළඳසැල මෙතෙක් කර ගෙන ආ මෙම බදු කරු හටම 2022 වර්ෂයේ බදු මුදලට 10% ක් වැඩි කර ලබා දීමට කටයුතු සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 07**

2022.06.17 දිනැති මහ සභා තීරණයට අනුව මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රජාශාලාවේ වාහන අංගනයේ බිම පස් අතුරා කොන්ක්‍රීට් කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර, මෙහි පස් අතුරා තැලීමට ලක් කර දැනට සකස් කර ඇති අතර, පවතින මුදල් තත්ත්වය මත මෙහි කොන්ක්‍රීට් කිරීමට අපහසු මට්ටමේ පවතින බැවින්, මෙහි සභා අරමුදලින් ග්‍රැවල් යොදා තලා මට්ටම් කර සකස් කිරීම සඳහා මහා සභාවේ සභා තීරණය හා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ප්‍රජා ශාලාවේ රථ ගාල සකස් කළ ද එහි බිම කොන්ක්‍රීට් කර ගැනමට නොහැකි වූ අතර මෙම තත්ත්වය මත මෙහි නතර කර තබන වාහන වලට යම් යම් හානිදායක තත්වයන් ඇති වීමට ඉඩ පවතින බව විගණනය විසින්ද පෙන්වා දී ඇති බැවින් මෙය කොන්ක්‍රීට් කිරමට විශාල මුදලක් දැරීමට සිදු වන බැවින් එය මේ මොහොතේ අපහසු කාර්යයක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරි මහතාගේ නිසි අධීක්ෂණය යටතේ ප්‍රජා ශාලාවේ වාහන අංගනයේ බිම ගෲවල් හෝ පස් පුරවා සුදුසු ආකාරයට විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ඉතා කඩිනමින් සකස් කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 08**

2023 වර්ෂයට අදාලව වරිපනම් බදු, වෙළඳබලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු, කර්මාන්ත බදු, ප්‍රචාරක දැන්වීම් ගාස්තු, ඉල්ලුම්පත් හා සහතිකපත් ගාස්තු, ක්‍රීඩාපිටිය, ප්‍රජාශාලාව ,සුසාන භූමිය, ආදාහනාගාරය සඳහා අය කරන ගාස්තු ආදිය අය කර ගැනීම සඳහා ප්‍රසිද්ධ කිරීමට අදාල ගැසට් නිවේදනය කෙටුම්පත් කිරීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට වයි.උපුල් ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.එහිදී රට තුළ කඩා වැටී ඇති ආර්ථික තත්ත්වය හමුවේ මහජනතාව ඉතාමත් පීඩාවට පත්ව ඇති මොහොතක බදු හා ගාස්තු අය කිරීම් වල මුදල් වැඩිකිරීමක් සිදු නොකර පැවති ගාස්තු යටතේම 2023 වර්ෂයට ගැසට් කළ යුතු බව වැඩි දුරටත් ප්‍රකාශ කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

2023 වර්ෂයට ප්‍රාදේශීය සභාවට ගාස්තු අය කිරීම වෙනුවෙන් අදාල සියලුම අංශ වලට අදාල ගාස්තු අය කිරීම සඳහා ගාස්තු වැඩි කිරීමකින් තොරව ගැසට් නිවේදනය කෙටුම්පත් කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි. නමුත් 2022 වර්ෂයට අදාල බදු හා ගාස්තු පිළිබඳ ගැසට් පත්‍රය පල කිරීමෙන් පසු යම් යම් අංශ වෙනුවෙන් සංශෝධනය කළ ගාස්තු ප්‍රමාණයන්ද ගැසට් කිරීමට පියවර ගැනීම සුදුසු බවටත් සභාව අනුමත කරන ලදි.

**යෝජනා අංක 09**

මේ වන විට ඔබ සියලු දෙනා වෙත ඉදිරිපත් කර ඇති 2023 වර්ෂයට අදාලව සකස් කර ඇති අය වැය කෙටුම්පත සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සහ සංශෝධන පවතීනම් ඒවා නිවරදි කර හා තව දුරටත් යෝජනා ඇත්නම් ඒවාද ඇතුලත් කොට මෙම අය වැය කෙටුම්පත සඳහා මහ සභාවේ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් විජේරත්න ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මේ වන විට දින හතරකට පෙර සියලුම සභික වරුන් වෙත ලබාදී ඇති 2023 වර්ෂයට අදාළව සකස් කරන ලද අයවැය කෙටුම්පත අද දින සාකච්ඡා කර සංශෝධනය ඇත්නම් ඒවා නිවැරදි

කර තවදුරටත් නව යෝජනා ඇතුළත් කිරීමට ඇත්නම් ඒවා ලිඛිතව බාර දෙන ලෙසද සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

එහිදී තීරණය කරන ලද්දේ මෙම අය වැය කෙටුම්පතට අදාල අදහස් යෝජනා හා ආදායම් උත්පාදන තොරතුරු ඇත්නම් ඒවාද ඇතුලත් කිරීමට හැකි වන පරිදි 2022.09.30 වන දිනට පෙර ලිඛිතව ලබා දෙන ලෙසත් ඉන් පසු විශේෂ මහ සභාවක් කැඳවා 2023 වර්ෂයට අදාළව සකස් කරන ලද අයවැය සභා සම්මත කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 10**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් නව බස් නැවතුම්පොල කඩ කාමර සහ නව තොග පොළ භූමියේ කඩ කාමර ප්‍රසිද්ධියේ වෙන්දේසි කර බදු කරුවන් වෙත ලබා දී තිබුනද මෙම කඩ කාමර බදු දීමේදී එක් එක් කඩ කාමරයට අදාල ප්‍රධාන මුදල් ගෙවා අවසන් කර ගිවිසුම් ගත විය යුතු වුවද අදාල බදු කරුවන්ගෙන් කිහිප දෙනෙක් මේ වන විටත් ප්‍රධාන මුදල් ගෙවා අවසන් කර නොමැති අතර මේ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදීම අදාල බදු කරුවන් දැනුවත් කළද මෙම මුදල් තවමත් ගෙවා අවසන් කර නොමැති බැවින් මෙම තත්ත්වය අවස්ථා කිහිපයකදීම විගණන විමසුම්වලටද ලක් වී ඇති අතර මෙසේ අය වීමට ඇති මේ සමග ඉදිරිපත් කර ඇති බදු කරුවන්ගේ තොරතුරු වලට අදාල හිඟ මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් සභා අනුමැතිය හා තීරණය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

<u>නව තොගපොල භූමියේ කඩ කාමර</u>

| අනු අංකය | කඩ කාමර අංකය | බදුකරුගේ නම | ප්‍රධාන මුදල | ගෙවා ඇති මුදල | ගෙවීමට ඇති ඉතිරි මුදල |
|---|---|---|---|---|---|
| 01 | 02 | කේ.එම්.ලලිත් විජේසිරි | 865,590.90 | 375,000.00 | 490,590.90 |
| 02 | 03 | කේ.එම්.බන්දුල සුදරශණ | 731,500.00 | 626,500.00 | 105,000.00 |
| 03 | 12 | ඩබ්.ආර්.කාංචනා ලක්මාලී | 642,100.00 | 20,000.00 | 622,100.00 |
| 04 | 13 | එච්.ඒ.නිශාන්ත ගුණවරධන | 1,020,500.00 | 25,000.00 | 995,500.00 |
| 05 | 14 | කේ.එම්.එම්.රිස්වාන් | 702,100.00 | 250,000.00 | 452,100.00 |
| 06 | 15 | වයි.ආර්.නිමල් ජයතිලක | 706,998.00 | 195,000.00 | 511,998.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 07 | 16 | ඒ.එම්.ජගත් ඉන්දික කුමාර | 643,000.00 | 143,000.00 | 500,000.00 |
| | | **එකතුව** | | | **3,677,288.90** |

**<u>නව බස් නැවතුම්පල (නව) කඩ කාමර</u>**

| අනු අංකය | කඩ කාමර අංකය | බදුකරුගේ නම | ප්‍රධාන මුදල | ගෙවා ඇති මුදල | ගෙවීමට ඇති ඉතිරි මුදල |
|---|---|---|---|---|---|
| 01 | බිම් මහල 2 | එච්.පී.අජිත් ඉන්ද්‍රසිරි (ප්‍රියන්ත ගාමිණි) | 3,601,350.00 | 1,707,350.00 | 1,894,000.00 |
| 02 | උඩු මහළ 06 | කන්දසාමි දේවකුමාරි | 1,700,600.25 | 725,150.06 | 975,450.19 |
| 03 | 08 | ඩබ්.ජී.සමීර මාදම්පිටිය | 1,910,000.00 | 677,500.00 | 11,322,500.00 |
| 04 | 09 | ඊ.එම්.සංජීව උදය කුමාර | 2,050,000.00 | 512,500.00 | 1,537,500.00 |
| 05 | 10 | ඒ.කපිල චමින්ද කුමාර | 1,799,127.00 | 450,000.00 | 1,349,127.00 |
| 06 | 18 | ආර්.ඒ.පැතුම් නිලංගිකා | 1,782,825.50 | 775,000.00 | 1,007,825.00 |
| 07 | 20 | ආර්.ඒ.පැත්මි නිලංගිකා | 2,100,325.50 | 525,081.37 | 1,575,244.13 |
| | | **එකතුව** | | | **9,471,646.32** |

මෙම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

ඉදිරියේදී ප්‍රාදේශීය සභා විසුරුවා හැරීමට ඇති අවස්ථාව වැඩි බැවින් මෙම හිඟ මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් අපි මැදිහත් වී කටයුතු කළ යුතු බැවින් මෙම බදු කරුවන් අතරින් ඔබ දන්නා හඳුනන බදු කරුවන් සිටීනම් අදාල හිඟ මුදල් කඩිනමින් ගෙවා අවසන් කරන ලෙසට දැනුම් දෙන ලෙස ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදි.

මෙම යෝජනා සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනා සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම හිඟ මුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කරන ලෙසට දැනුම් දෙන ලෙසට නිවේදන සකස් කර සභාව මගින් නැවත මෙම බදු කරුවන් සියලු දෙනාහට දැනුවත් කර යැවීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී. තවද මේ සම්බන්ධයෙන් සභා ලේකම්තුමන්ද දිගින් දිගටම දැනුවත් කිරීම් කරන බැවින් ඊට අදාල ලිපි නැවත සකස් කර යවන ලෙසට ලේකම් තුමාට දැනුම් දෙන ලදි.

ඒ වගේම නගරයේ අලුතින් ඉදිකරන ලද කඩ කාමර 4 ටෙන්ඩර් ක්‍රමවේදයට අනුව ටෙන්ඩර් කර බදු කරුවන් හතර දෙනකු විසින් එම කඩ කාමර ලබාගත්තද ඔවුන් විසින් මේ තාක් ගිවිසුම් අත්සන් කිරීමට ඉදිරිපත් නොවීම මත මෙම කඩ කාමර නැවත ටෙන්ඩර් කරමු බව ගරු සභාපතිතුමා යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රී තුමන් විසින් ස්ථිර කර සිටින ලදි.

එහිදී එම කඩ කාමර නැවත ටෙන්ඩර් කිරීමට පෙර මේ සඳහා දැනට ලබා දී ඇති තක්සේරු මුදල ඉතා වැඩි අගයක් ගන්නා බැවින් ඉදිරියට මෙය ගැටලු සහගත තත්ත්වයක් ගෙන දෙන බැවින් අදාල නිලධාරීන් සමඟ සාකච්ඡා කර ඉතා කඩිනමින් මෙය නැවත තක්සේරු කර මුදල් අඩු කර ගැනීමට කටයුතු කර අනතුරුව ටෙන්ඩර් කිරීම සුදුසු බවට උපුල් ගරු මන්ත්‍රී තුමා මන්ත්‍රීතුමා වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින ලදි.

මෙය නැවත තක්සේරු කිරීමට නොහැකි බවත්, මේ සඳහා විධිමත්ව කර ඇති තක්සේරුවේ ගැටලු සහ ගත තත්ත්යක් නොමැති බවත්,ගරු සභාපතිතුමන් සඳහන් කර සිටින ලදි.

අනතුරුව මෙය නැවත තක්සේරු කිරීම අවශ්‍ය නොවන බවත්,මෙම කඩ කාමර 4 නැවත ටෙන්ඩර් කිරීම සුදුසු බවටත්,කලින් ටෙන්ඩර් ලබා ගෙන අතහැර ඇති අයගේ නම් අසාදු ගත ලේඛණයට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු බවත් සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 11**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් බදු දී ඇති කඩ කාමරවලින් මාසිකව බදු මුදල් අයවියයුතු වුවද ඇතැම් කඩ කාමරවලින් නිසි පරිදි බදු මුදල් අය නොවීම හේතුවෙන් අපගේ ගිණුම්වල විශාල හිඟයක් පෙන්නුම් කරන බවත්,මෙම තත්වය දිගින් දිගටම විගණන විමසුම්වලට පවා ලක් වී ඇති කාරණාවක් බවට පත් වී බැවින් මෙම කඩ කාමරවලට අදාලව මේ සමඟ ඉදිරිපත් කර ඇති හිඟ මුදල් සම්බන්ධ තොරතුරු වලට අදාල මෙම හිග මුදලින් මාස දෙකකට අදාල බදු මුදල් 2021 වරෂයයේ 2021.08.24 වන දින ගන්නා ලද මහ සභා තීරණයට අනුව බදු සහන වශයෙන් ලබා දී ඇති අතර ඉතිරි බදු මදල් අය කර ගැනීම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග සඳහා සහා අනුමැතිය හා තීරණය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

| නව වෙළඳ සංකීරණයේ කඩ කාමර | | | | |
|---|---|---|---|---|
| | | | | |
| අනු අංකය | කඩ කාමර අංකය | බදු කරුගේ නම | ගෙවා ඇති මුදල | ඉතිරි හිඟ මුදල |
| 1 | 16 | පෙම්ජිත් අල්ගේවත්ත | 156,000.00 | 92,000.00 |
| ගහබඩ කඩ කාමර | | | | |
| 1 | 2 | ඒ.කේ.ජී අමරසිංහ | 74,400.00 | 43,400.00 |
| 2 | 5 | ආර්.එම්.චන්ද්‍රකාන්ත | 74,400.00 | 51,335.74 |
| නව බස් නැවතුම්පල කඩ කාමර (නව) **22** | | | | |
| 1 | උඩු මහළ 1 | ටියුඩර් පණ්ඩිත ගුණවරධන | 60,000.00 | 40,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2 | 2 | එස්. නිශාන්ත කුමාර | 60,000.00 | 40,000.00 |
| 3 | 3 | ඩී.එම්.චමින්ද කුමාර | 60,000.00 | 40,000.00 |
| 4 | 4 | ආර්.එම්. සුනිල් කුමාර | 60,000.00 | 40,000.00 |
| 5 | 5 | ජී.පී. අනූජා ප්‍රියන්ති | 60,000.00 | 40,000.00 |
| 6 | 6 | කන්දසාමි දේවකුමාරි | 60,000.00 | 40,000.00 |
| 7 | 9 | සංජීව උදය කුමාර | 60,000.00 | 40,000.00 |
| 8 | 10 | කපිල චමින්ද කුමාර | 60,000.00 | 40,000.00 |
| 9 | 14 | ප්‍රගීත් තිලකරත්න | 60,000.00 | 40,000.00 |
| 10 | 17 | ඩී.එම්.පී.ගාමිණී | 60,000.00 | 40,000.00 |
| 11 | 18 | ආර්.ඒ.පැතුම් නිලංගිකා | 60,000.00 | 40,000.00 |
| 12 | 20 | ආර්.ඒ.පැතුම් නිලංගිකා | 120,000.00 | 80,000.00 |
| | | | | **520,000.00** |

**නව තොග පොළ භූමියේ කඩ කාමර**

| අනු අංකය | කඩ කාමර අංකය | නම | බිල් කිරිම | මාසික කුලිය | 2022 අගෝස්තු මාසය තෙක් 50000 ට වැඩි |
|---|---|---|---|---|---|
| | | | | | |
| 1 | 2 | කේ.එම්.ලලිත් විජේසිරි | 33,000.00 | 2,750.00 | 85,000.00 |
| 2 | 3 | කේ.එම්. බන්දුල සුදරශණ | 33,000.00 | 2,750.00 | 55,000.00 |
| 3 | 4 | චරිත ප්‍රභාෂ දෙනිපිටිය | 33,000.00 | 2,750.00 | 55,000.00 |
| 4 | 5 | වයි.ආරියදාස | 33,000.00 | 2,750.00 | 49,000.00 |
| 6 | 7 | අරුණ උදය කුමාර | 32,100.00 | 2,675.00 | 56,150.00 |
| 7 | 8 | එස්.ඩී. නිශාන්ත කුමාර | 32,100.00 | 2,675.00 | 58,850.00 |
| 8 | 9 | හෂාන් පරණමාන | 32,100.00 | 2,675.00 | 53,500.00 |
| 9 | 12 | ඩබ්.ආර්.කාංචනා ලක්මාලී | 32,100.00 | 2,675.00 | 77,700.00 |
| 10 | 13 | එච්.ඒ.නිශාන්ත ගුණවරධන | 51,000.00 | 4,250.00 | 161,500.00 |
| 11 | 14 | කේ.එම්.එම්.රිස්වාන් | 32,100.00 | 2,675.00 | 109,675.00 |
| | | | | | **761,375.00** |

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම හිඟ මුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කරන ලෙසට දැනුම් දෙන ලෙසට නිවේදන සකස් කර සභාව මගින් නැවත මෙම බදු කරුවන් සියලු දෙනාහට දැනුවත් කර යැවීම සුදුසු බවටත් එසේ ලබා දෙනු ලබන කාල සීමාව තුළ අදාල මුදල් නොගෙවන්නේනම් මෙම දේපල සභාව සතු කර ගැනීමට කටයුතු කරන බවද දන්වා යැවීමට කටයුතු කිරීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 12**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළඳපොලේ අංක 05 දරණ මාලු වෙළඳසැල දීර්ඝ කාලයක සිට ටෙන්ඩර් මගින් ලබාගෙන පවත්වාගෙන යන අතර, 2019 සිට 2022 වර්ෂය දක්වා රටේ පැවති කොරෝණා වසංගතය හා ඉන්ධන අර්බුදය පැවතියද ප්‍රාදේශීය සභාවට ගෙවීමට තිබූ බදු මුදල් නිවැරදිව ගෙවා ගෙන ගිය අතර 2023 වර්ෂය සඳහා ටෙන්ඩර් නොකර මෙම වෙළඳ අයිතිය අදල කඩ කාමරයද සමඟ ලබා දෙන ලෙස මාලු වෙළඳසැල බදු කරු වන පවන් චමීර මහතා විසින් කර ඇති ඉල්ලීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ප්‍රදේශයේ බොහෝ තැන්වල මෙන්ම මාර්ග ද වල ජංගම මාලු වෙළඳාම් බහුලව පවතින බැවින් මෙම කඩ හිමියන්ට නිසි ආදායමක් නොලැබෙන බැවින් ඔවුන් මහත් අසරණ තත්ත්වයකට පත්ව ඇති අතර මේ සම්බන්ධයෙන්ද අවධානය යොමු කර සුදුසු සභා තීරණයක් ගන්නා ලෙස වයි.උපුල් ගරු මන්ත්‍රීතුමන් ප්‍රකාශ කර සිටින ලදි.

තවද සභාවට අයත් පොදු වෙළඳපොලේ මාලු වෙළඳසැල් 05 ක් පවතින බැවින් එක් අයෙකු විසින් පමණක් කර ඇති මෙම ඉල්ලීමට අනුමැතියක් ලබා දිය නොහැකි බව මහ සභාවේ සාකච්ඡා විය.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

දැනට සභාවට අයත් මාලු වෙළඳසැල් 05 ක් පවතින අතර එක් අයෙකුට පමණක් වෙනම වරප්‍රසාද ලබා දිය නොහැකි බැවින් ටෙන්ඩර් ක්‍රමවේදයට යටත්ව 2023 වර්ෂයට මෙම වෙළඳසැල් 05 ම ටෙන්ඩර් කර ලබා දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 13**

මොනරාගල හිදිකිවුල අවමංගල්‍යාධාර හා සුභ සාධක සමිතියේ ගරු සභාපතිතුමන් විසින් එම සමිතියට ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීම සඳහා හිටපු කෘෂිකර්ම අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමන් විසින් ජන වසමට අයත් පර්චස් 15 ක බිම් කොටසක් අනුමත කර දී ඇති අතර සාමාජිකයින් 350 ක් පමණ සිටින මෙම සුභ සාධක සමිතියේ ගොඩනැගිල්ල ඉදිකර ගැනීම සඳහා අදාල බිම් කොටසෙහි අත්තිවාරම සකස් කර ගැනීම සඳහා සභාව සතු බැකෝලෝඩර් යන්ත්‍රය ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කටයුත්ත කර ගැනීම සඳහා ඒ සඳහා අවශ්‍ය වේලාවට සභාව සතු බැකෝලෝඩර් යන්ත්‍රය ලබා දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 14**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් නව බස් නැවතුම්පල පිහිටි පලතුරු කඩ 22 ක් 2021 සැප්තැම්බර් මස කඩා ඉවත් කරන ලද අතර ඒ අනුව මෙම පලතුරු කඩ කඩා ඉවත් කරන අවස්ථාව වන විට බදුකරුවන් විසින් ගෙවියයුතු හිඟ බදු මුදල වශයෙන් රු.310,057.00 ක් පැවති අතර, එම හිඟ මුදලින් රු. 35,000.00 ක මුදලක් බදුකරුවන් විසින් පසුව ගෙවන ලද අතර ඒ අනුව ඉතිරි වන හිඟ බදු මුදල රු.275,057.00 ක් වන බවත් නමුත් මෙම බදු මුදලින් රු. 74,250.00 ක මුදලක් 2021 මැයි, ජුනි මාස සඳහා බදුකරුවන් වෙත ලබාදෙන ලද බදු සහනවලට ඇතුලත්ව ඇති බැවින්, පලතුරු කඩවලට අදාලව ගිණුමෙන් කපා හැරීමට අදාල මුදල රු.200,807.00 ක් වන බැවින් එයට අදාලව 2022.08.12 දින පැවති මහ සභා තීරණයට අනුව පලතුරු කඩවලට අදාල රු. 200,807.00 ක හිඟ මුදල (අදාල විෂය නිලධාරී විසින් ලබා දී ඇති මෙම තොරතුරුවලට අදාලව) අපගේ ගිණුමෙන් කපා හැරීමටත්, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට තමෝදාරම් ජයජීලන් ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට ඉදිරිපත් කර ඒ අනුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 15**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් වාහන, යන්ත්‍රෝපකරණ සඳහා පහත විස්තර සඳහන් අමතර කොටස් ලබා ගැනීම, අළුත්වැඩියාවන් සිදු කිරීම ආදී කටයුතු සඳහා වැය වන මුදල් සභා අරමුදලින් ගෙවීම් කිරීම සඳහා සහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

| අනු අක | වාහන අංකය | විස්තරය | මුදල රු. |
|---|---|---|---|
| 01 | ZA 5061 | බැකෝ ලෝඩරයේ වැල් බොක්ස් එකේ හෝස් එක ගැසීම | 8300.00 |
| 02 | ZA 5061 | බැකෝ ලෝඩරයේ හයිඩ්‍රොලික් ටැංකියේ සිට පොම්පය දක්වා හෝස් එක ගැසීම | 9400.00 |
| 03 | LL-7682 | කෘෂ කැබ් රථයේ පිල්ටර් හෙඩ් එක අළුතින් දැමීම | 16800.00 |
| 04 | LL-6980 | ට්‍රක් රථයේ බ්‍රේක් ස්ප්‍රින් දැමීම හා වැඩ කුලිය | 8200.00 |
| 05 | 37-9430 | ට්‍රැක්ටර් රථයේ ස්ටාටර් මෝටරයේ රී කන්ඩිෂන් හවුසින් එකක් දැමීම හා කොයිල් සෙට් සාදා බුෂ් හා ස්ටාටර් මෝටරය සකස් කිරීම | 11300.00 |
| 06 | 37-9430 | ට්‍රැක්ටර් රථය සඳහා හිච් කොකු 02ක් මිලදී ගැනීම | 3960.00 |
| 07 | WP LF-1135 | ගනි නිවන රථයේ AC පද්ධතියේ අළුත්වැඩියාවට උපකරණ මිලදී ගැනීම. | 90,000.00 |
| 08 | WP LF-1135 | ගනි නිවන රථයේ AC පද්ධතියේ අළුත්වැඩියාවට අමතර කොටස් දමා වැඩ කුලිය. | 41,200.00 |
| 09 | WP LF-1135 | ගිනි නිවන රථයේ DS 40ක් ඔයිල් ලීටර් 01ක් හා බ්‍රේක් ඔයිල් මි.මී.500ක් මිලදී ගැනීම. | 2880.00<br>2750.00 |

එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

අදාල පරීක්ෂණ වාර්තාවන්ට අනුව ඉදිරිපත් කර ඇති මෙම වාහන අලුත්වැඩියා කටයුතු සහ අමතර කොටස් යෙදීම, වාර සේවා කටයුතු සුදුසු පරිදි විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 16**

නව පොළ භූමිය ඇති ඉඩම් අක්කර 05 සඳහා බදු ගෙවීම සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට දැනුම් දීම සම්බන්ධයෙන් සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම භූමියේ අයිතිය ප්‍රාදේශීය සභාවට අදාල ගොඩනැගිලිඉදිකිරීම සඳහා ලබා දී තිබුණද මෙතෙක් බදු ගෙවීමක් සිදු නොකළ අතර වතු සංවර්ධන මණ්ඩලයෙන් මේ සඳහා බදු මුදලක් ගෙවන ලෙසට අප වෙත දැනුම් දී ඇති බවට ගරු සභාපතිතුමන් සඳහන් කර සිටි අතර මේ සඳහා බදු ගෙවීමකට ප්‍රාදේශීය සභාව යටත් වුවහොත් මෙම භූමය තුළ ඕනෑම ඉදිකිරීමක් කිරීමට අයිතිය ලැබෙන බව ද සඳහන් කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

අදාල නිලධාරීන් සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර ඔවුන් ඇතුලුව මන්ත්‍රීවරුන් 3 දෙනෙකු පමණ සභාවට ගෙන්වා කෙටි සාකච්ඡාවක් මගින් මේ සඳහා ගෙවීමට යම් බදු මුදලක් තීරණය කර විධිමත් ක්‍රම වේදයන්ට යටත්ව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 17**

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සියලුම වරිපනම් කොට්ඨාශයන්හී (කොට්ඨාශ 06) වසර කිහිපයක සිට ගෙවීම් සිදු නොකරන ලද රු.10,000.00 වැඩි හිඟ වරිපනම් සම්බන්ධයෙන් සහ එම දේපල වලට අදාලව 2022.08.30 දින වන විට පවතින හිඟ බදු මුදල් සම්බන්ධයෙන් සහ ප්‍රාදේශීය සභා ජල යෝජනා ක්‍රමයෙන් ජල සම්බන්ධතා ලබා

ගෙන ඇති ජල පාරිභෝගිකයින්ගේ ද 2022.08.30 දින වන විට පවතින රු.10,000.00 වැඩි හිඟ මුදල් සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සභා තීරණය සහ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රිතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

වරිපනම් හිඟ මුදල් මෙම මාසය තුළ ජංගම සේවා පවත්වා අය කර ගැනීමට කටයුතු කර ඉන් පසුව ඉතිරිවන හිඟ මුදල් සම්බන්ධයෙන් නැවත සභා තීරණයක් ගැනීම සුදුසු බවත්,ජල හිඟ මුදල් අය කර ගැනීමට සියලුම පාරිභෝගිකයින් වෙත තව දුරටත් දන්වා යැවීම සුදුසු බවත්, ආදායම් පරීක්ෂක වරුන් යොදවා හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදි.

## 05.2 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ක්‍රිශාන්ත රත්නායක මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව

### යෝජනා අංක 01

මොනරාගල වැදිකුඹුර පාර **කුරුළු** මහතාගේ නිවස මාර්ගයේ කුඹුරු මාර්ගය දක්වා සහ මාගන්දන මුල්ල සමගි මාවත කිතුලයාය ගල උඩ මාර්ගය සඳහා ජල නළ එලීම සඳහා පෞද්ගලික කුලී යන්ත්‍රයක් යොදවා සභා අරමුදලින් ගෙවීමට යටත්ව කාණු කැපීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන් විසින් සභාවට යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රිතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභාවේ බැකෝ ලෝඩර් යන්ත්‍රය යොදවා හෝ කුලී පදනම මත වාහනයක් යොදවා ගෙන හෝ සභා අරමුදලින් ගෙවීම් කිරීමට යටත්ව අවශ්‍ය කාණු කපා ගැනීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 05.3 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී රංජිත් රත්නායක මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව

### යෝජනා අංක 01

මොනරාගල කච්චේරිය හංදිය ප්‍රජා ශාලාව මාර්ගයේ තරුණ සේවා කාර්යාලය ඉදිරිපිට කුමාරපුරට වැටී ඇති මාර්ගය දැඩි ලෙස අබලන් තත්ත්වයේ පවතින බැවින් එම මාර්ගයට ග්‍රැවල් යොදා පිළිසකර කර දීම සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රී තුමන් විසින් සභාවට යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට රමණී රත්නායක ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම මාර්ගයේ විශාල වලවල්ද හැරී ගැටලු සහගත තත්ත්වයක්ද ගෙන දී ඇති බැවින් එසේ සංවර්ධනය කළ යුතු කොටස කාර්මික නිලධාරී මහතාගේ අධීක්ෂණය යටතේ ග්‍රැවල් ලෝඩ් 2 ක් පමණ යොදා මෙම මාර්ගය කඩිනමින් සකස් කර දීම  සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

- **කල් දී නොමැති හදිසි යෝජනා ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදි කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු කල් දී නොමැති යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර, ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක් නොමැතිව එකඟතාවය එල කර සිටි  බැවින් ගරු සභාපතිතුමා විසින් එම කල් දී නොමැති යෝජනා හා සාකච්ඡා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදි.

I. 2022 වර්ෂයේ අය වැය යෝජනා යටතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැසිකිළි පහසුකම් වෙනුවෙන් ද්‍රව්‍යමය ආධාර ලබා දීම යටතේ රු.1,000,000.00 ක මුදලක් වෙන් කර ඇති අතර මේ සම්බන්ධයෙන් මහ සභාවේ සාකච්ඡා කර මොනරාගල බල ප්‍රදේශයේ සෑම කොට්ඨාශයක්ම නියෝජනය වන පරිදි තෝරා ගත් අඩු ආදායම්ලාභී පවුල් වල තොරතුරු ඇතුලත් යෝජනා සකස් කර ඉදිරි සතිය ඇතුලත විෂය භාර නිලධාරී හට ලැබීමට සලස්වන ලෙසත්,අනතුරුව එසේ ඉදිරිපත් කරන යෝජනා සියල්ල ලබන මස මහ සභාවට න්‍යාය පත්‍රානුකූලව  ඉදිරිපත් කර සභා අනුමැතිය ඇතිව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට අවශ්‍ය බැවින් ඊට අදාල යෝජනා කඩිනමින් ආයතනය වෙත ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මේ සඳහා ගරු මන්ත්‍රීවරුන් විසින් ලබා දෙන අදාල යෝජනා ඉදිරි මහ සභාවේදී සාකච්ඡා කර සභා අනුමැතියක් ගෙන ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට ඉදිරිපත් කර ඒ අනුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට මහ සභාවේ සාකච්ඡා කර තීරණය කරන ලදි.

II. මොනරාගල නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිළියෙල කරන ලද මොනරාගල නගර සංවර්ධන සැලැස්ම ප්‍රාදේශීය සභාවත් සමඟ සාකච්ඡා කර ගැනීම සඳහා දිනයක් සහ වේලාවක් ලබා දෙන ලෙසට දන්වා ඇති බැවින් ඒ සඳහා තීරණයක් ගත යුතු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත ප්‍රකාශ කර සිටින ලදි.

මේ සම්බන්ධව සභාවේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව 2022.09.27 වන අඟහරුවාදා දින පෙ.ව.10.00ට යොදා ගැනීම සුදුසු බවට සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

III. වර්ථමානයේ වෙළඳපොලේ පවතින මිල ගණන් වලට අනුව මොනරාගල ප්‍රාදේශීය සභාව මගින් නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 01ක් නිෂ්පාදනය කිරීමට සහ විකිණීම සඳහා ඇසුරුම් කිරීමට දැනට යන වියදමට අනුව මෙම පොහොර කිලෝ ග්‍රෑම් 01ක් අලෙවි කරනු ලබන රු.20.00ක මුදල රුපියල් 30.00 දක්වා වැඩි කර අලෙවි කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.
වර්ථමානයේ වෙළඳපොලේ පවතින මිල ගණන් සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභාව මගින් නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 01ක නව මිල වශයෙන් 2022.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.30.00 දක්වා වැඩි කර අලෙවි කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

IV. මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් ගල්රෝල යන්ත්‍රය යම් කර්මාන්තයක් සඳහා රැගෙන යන අවස්ථාවලදී අදාල කර්මාන්තය නිම වීමෙන් පසුව යන්ත්‍රය නැවත සභාවට භාර

දීම සඳහා වැඩි දින ගණනක් ගත කරන බැවින් අදාල වැඩ අවසන් වූ පස් මෙසේ පමා කරණ සෑම දිනයක් වෙනුවෙන්ම එක් දිනයක් අතහැර යන්ත්‍රය රඳවා ගන්නා සෑම ප්‍රමාද දිනයකටම මෙතෙක් අය කරන ලද රු.500.00ක මුදල රු.1000.00 දක්වා වැඩි කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ප්‍රාදේශීය සභාවට අයත් රෝලර් යන්ත්‍රය යම් කර්මාන්තයක් සඳහා රැගෙන යන අවස්ථාවලදී අදාල කර්මාන්තය නිම වීමෙන් පසුව ප්‍රමාද වන පළමු දිනය අතහැර යන්ත්‍රය රඳවා ගන්නා අනෙකුත් සෑම ප්‍රමාද දිනයකටම මෙතෙක් අය කරන ලද රු.500.00ක මුදල රු.1000.00 දක්වා වැඩි කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

V. මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් යන්ත්‍රෝපකරණ වලින් සිදු කරන සේවාවන් සඳහා වර්ථමානයේ පවතින ඉන්ධන මිල සහ අලුත්වැඩියා හා අමතර කොටස් වල මිල දැඩි ලෙස ඉහල ගොස් ඇති බැවින් මෙම කාරනා පදනම් කර ගනිමින් පහත සඳහන් ආකාරයට අය කරනු ලබන ගාස්තු සංශෝධනය කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| යන්ත්‍රෝපකරණ වර්ගය | කලින් පැවති මිල ගණන | සංශෝධනය සඳහා ඉදිරිපත් කරන මිල ගණන |
|---|---|---|
| බැකෝලෝඩර් යන්ත්‍රය | පැයකට රු. 5000/= | පැයකට රු. **6500**/= |
| මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය | පැයකට රු. 4000/= හා පැයකට ඩීසල් ලී. 10 ක් සඳහා මුදල් | පැයකට රු. **7000/=** හා පැයකට ඩීසල් ලී. 10 ක් සඳහා මුදල් |
| ගලි රථය | බල ප්‍රදේශයෙන් පිටත ප්‍රවාහන ගාස්තුව 1 Km සඳහා (යන දුර සඳහා) රු.200/= යි | බල ප්‍රදේශයෙන් පිටත ප්‍රවාහන ගාස්තුව 1 Km සඳහා (යන දුර සඳහා) රු.**300/=** යි |

එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.
පවතින වර්ථමාන තත්ත්වය හමුවේ වාහන සඳහා අය කරනු ලැබූ ගාස්තු ප්‍රමාණවත් නොවන බැවින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් ආකාරයටම සභාව සතු මෝටර්ග්‍රේඩර් යන්ත්‍රයේත්,බැකෝලෝඩර් යන්ත්‍රයේත්, ගලි රථයේත් සංශෝධනය සඳහා ඉදිරිපත් කල මිල ගණන් ඒ ආකාරයෙන්ම 2022.10.01 දින සිට අය කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

## 06. ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2022.08.01 දින සිට 2022.08.31 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන්ගේ සහ චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථීරත්වයෙන් සභාවේ විරෝධතාවයන් ද නොමැතිවූ බැවින්, පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. කමිටු වාර්තා සලකා බැලීම

ඉදිරිපත් වී නොමැත

## 08. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරිම බැවින්,වෙනත් කරුණු සමඟම සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදි.

### 08.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - උදේනි රම්‍යලතා මැතිතුමිය

I. අවසර ගැනීමෙන් අනතුරුව 2022.09.16 වන අද දින අපගේ බල ප්‍රදේශයේ ප්‍රධාන පාසලක් වන මො/රාජකීය ජාතික පාසලට සජිත් ප්‍රේමදාස ගරු විපක්ෂනායක තුමන් විසින් බස් රථයක් ප්‍රදානය කළ අතර රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍යායාවක් වශයෙන් මේ කාරණය සම්බන්ධයෙන් තමන් පෞද්ගලිකව මහත් සතුටක් භුක්ති විඳින බවත්, ඒ වගේම මේ රටේ සංවර්ධනය වෙනුවෙන්, ජනතාව වෙනුවෙන්, හෙට ලොව භාර ගැනීමට සිටින දූවා දරුවන් වෙනුවෙන් හොඳ දේවල් කිරීමට එතුමන්ට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ගරු මන්ත්‍රී තුමිය සඳහන් කර සිටින ලදි.

II. ඒ වගේම රනිල් වික්‍රමසිංහ ගරු ජනාධිපතිතුමන් රටේ නායකත්වය භාර ගැනීමත් සමග බොහෝ ප්‍රශ්න රාශියකට විසඳුම් ලැබුණු අතර ජනතාවට යම්කිසි සැනසීමක් ලැබී ඇති බැවින් රටේ ඉදිරි කටයුතු සාර්ථකව කරගෙන යාමට ගරු ජනාධිපතිතුමන්ට ද ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් ගරු මන්ත්‍රීතුමිය සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

මොනරාගල රාජකීය ජාතික පාසලට බස් රථයක් ලබා දීම සම්බන්ධයෙන් සජිත් ප්‍රේමදාස විපක්ෂ නායක තුමන්ට අපගේ ස්තූතිය පුද කර සිටින බවට ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

## 08.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ගුණවර්ධන මැතිතුමා

I. අවසර ගැනීමෙන් අනතුරුව වැදිකුඹුර නවෝදයා පෙර පාසලට විදුලිය ලබා ගැනීම සඳහා වයරින් උපකරණ ලබාගැනීම වෙනුවෙන් පෙර පාසල් පාලිකාව විසින් කර ඇති ඉල්ලීමක් සම්බන්ධයෙන් මීට පෙර ගරු සභාපතිතුමන් දැනුවත් කර ඇති ආකාරයට වැඩි වියදමක් නොයන බැවින් මේ සඳහා අවශ්‍ය වයරින් බඩු ටික ලබාදීමට කටයුතු කරදෙන ලෙස ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි. ඒ වගේම පසුගිය සභා වාර කිහිපයකදීම නීත්‍යානුකූලව සභා සම්මත වූ යෝජනා කිහිපයක්ම තවමත් ක්‍රියාත්මක වී නොමැති බවත්, ඒ අතරින් වෙහෙරගල පන්සලේ සිට තෙළබෝගල හන්දිය දක්වා ජල නල පද්දතිය දීර්ඝ කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබාදී ඇති බවත්, ඒ වගේම බෝ හිටිය වසමේ අලුත්වත්ත නිවාස 6කට මීටර් 200 ක් පමණ ජල නල පද්දතිය දීර්ඝ කර දීම සම්බන්ධයෙන් ද සභා අනුමැතිය ලබාදී ඇති අතර එයද තවමත් ක්‍රියාත්මක වී නොමැති බැවින් ඒ සම්බන්ධව අවධානය යොමුකර අවශ්‍ය කටයුතු කඩිනමින් සලසා දෙන ලෙස ගරු මන්ත්‍රිතුමා සඳහන් කර සිටින ලදි.

II. ඒ වගේම ඉදිරි වැසි සමයත් සමග වගා කටයුතු කිරීම ආරම්භ වන බැවින් තම කොට්ඨාශයේ කෘෂි අතුරු මාර්ග බොහෝමයක් මෝටර්ග්‍රේඩර් කර සකස් කර ගැනීමට තිබෙන බැවින් සභාවේ බැකෝ ලෝඩර් යන්ත්‍රයත්, මෝටර්ග්‍රේඩර් යන්ත්‍රයත් යම් කිසි දින කීපයකට ලබා දෙන ලෙස ගරු මන්ත්‍රිතුමා ඉල්ලීම් කර සිටින ලදි.

III. පසුගිය කාලයේදී සභා අරමුදලින් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසමකට එක් සංවර්ධන කටයුත්තක් සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දිය හැකි බවට ගරු සභාපතිතුමන් අප වෙත දැනුම් දී තිබූ ආකාරයට ඉදිරියේදී සභාවේ පවතින ප්‍රතිපාදන හා බලතල ප්‍රකාරව මෙම වැඩ පිළිවෙල සිදු කර දෙන ලෙස ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කරමින් සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

ජල නල එලීමේ දී කාණු කැපීමට පෙර ජල පහසුකම් ලබා දිය හැකිද යන්න ජල සම්පාදන මණ්ඩලයෙන් විමසීමක් කර තහවුරු කර ගැනීමෙන් පසුව අවශ්‍ය කාණු කපා සකස් කර දිය හැකි බවට ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි. ඒ වගේම අතුරු මාර්ග කැපීම ප්‍රමාද වූයේ වාහන වලට ඉන්ධන ලබා දීමේ ප්‍රමාණය ඉතා සීමිත බැවින් වන අතර මේ ගැටලුව කෙසේ හෝ විසඳාගෙන ඉදිරි සති කිහිපය තුළ ප්‍රදේශයේ කෘෂි අතුරු මාර්ග සියල්ල කපා සකස් කර දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

## 08.3 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අතුල කුමාරසිරි මැතිතුමා

I. අවසර ගැනීමෙන් අනතුරුව හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරයෙක් සහ සභාපති වරයෙක් වශයෙන් ප්‍රදේශයට මහත් සේවාවක් සිදු කළ පුද්ගලයකු වශයෙන් පසුගිය දිනක හදිසියේ මියගිය එම්.ටී.සිරිසේන මැතිතුමන්ගේ අභාවය සම්බන්ධව අපි සියලු දෙනාගේම කණගාටුව ප්‍රකාශ කර සිටින අතර, පවුලේ ඥාතීන් වෙත ඒ බව දන්වා සභාවෙන් ශෝකප්‍රකාශයක් යැවීමට කටයුතු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

II. ඒ වගේම කුඹුක්කන ප්‍රදේශයේ ඇති රාජ්‍ය පරිපාලන නිවාඩු නිකේතනය සම්බන්ධයෙන් තොරතුරු කිහිපයක් දැන ගැනීමට ඇති අතර රාත්‍රී කාලයට නොයෙක් නොයෙක් පිරිස් එම ස්ථානයට ඇතුළු වී මත්පැන් භාවිතකර සින්දු කියමින් කෑ කෝ ගසමින් හැසිරෙන බව අවට ප්‍රදේශවාසීන් විසින් පවසා ඇති බැවින් මෙවැනි ස්ථානයක් තුළ තුල මේ ආකාරයෙන් කටයුතු සිදු නොවිය යුතු බැවින් මේ සඳහා වගකිවයුතු නිලධාරීන්ට මේ බව දන්වා යවා අවශ්‍ය කටයුතු සිදු කරන්න කියා ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

III. ඒ වගේම සභාවේ යන්ත්‍ර සූත්‍ර සංවර්ධන කටයුතු සඳහා ගම් මට්ටමින් යෙදවීමේදී එම ප්‍රදේශ වල පවත්වාගෙන යන විවිධ සමිති සමාගම් ඇති අතර ඒවායේ මුදල් ඕන තරම් පවතින බැවින් යන්ත්‍ර සූත්‍ර වාහන සඳහා එම සමිතිවලින් ඉන්ධන වියදම වත් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

IV. ඒ වගේම සභාවට අයත් සාප්පු වත්ත ඉඩම, බිබිල පාර ශරීර සුවතා භූමිය මේ වන විට විධිමත් පරිදි වැටවල් සකස් කර සම්පූර්ණ කර ඇති අතර ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාට ස්තුතිවන්ත වන බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ අතර වඩාත් ආරක්ෂිත භාවයක් ඇති වීමට මෙම උද්‍යාන වලට ශක්තිමත් ගේට්ටු සවිකර ආරක්ෂාකාරීව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු බැවින් ඒ සඳහා ද අවධානය යොමු කරන ලෙසත්, ඒ වගේම සභාවෙන් පාලනය වන මෙම විවේකී උද්‍යානවල යම් යම් නොගැලපෙන පුද්ගලයින් ( හිඟන්නන් වැනි) බංකු මත වාඩි වී සිටීම තුළ එම ස්ථානයට විවේකීව සිටීමට පැමිණෙන දුවා දරුවන්ට හා මවුපියන්ට එය

ගැටලුකාරී තත්ත්වයක් ගෙන දෙන බැවින් ඒ සම්බන්ධව නිරතුරු සොයා බැලීමක් කර අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටි අතර ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපි සියලු දෙනාම සාමූහිකව අපේ කටයුතු නිවැරදිව ඉදිරියටත් සිදු කරගෙන යමු බව සඳහන් කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තූතිය පුදකර සිටින ලදී.

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් සහ හිටපු සභාපති වරයෙක් වශයෙන් කටයුතු කළ එම්.ටී. සිරිසේන මැතිතුමන් පසුගිය දිනක හදිසියේ අභාවප්‍රාප්ත වූ අතර ඒ සම්බන්ධයෙන් සභාවේ සියලු දෙනාගේම ශෝකය පළකර සිටින බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම කුඹුක්කන රාජ්‍ය පරිපාලන නිවාඩු නිකේතනය තුළ මුරකරුවන් සිටිය දීත් මෙවැනි අකටයුතු දේවල් සිදුවෙනවා නම් එය ගැටලු සහගත තත්ත්වයක් බැවින් මේ සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්තුමන්ට දන්වා යැවීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම ආයතනයේ වාහන වලට ලබාදෙන ඉන්ධන සීමාවන්ට යටත්ව ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදු කිරීමේදී එය ප්‍රමාණවත් නොවන බැවින් තෙල් ප්‍රශ්නය සම්බන්ධයෙන් කඩිනමින් විසඳුමක් ලබාගැනීමට කටයුතු කරගෙන යන බවත්, ඒ වගේම සභාවට අයත් සියලුම උද්‍යානවල තත්ත්වයන් නිරතුරුවම අධීක්ෂණයට ලක්වෙන බවත් කෙසේ වෙතත් මේවායේ පවතින අඩුපාඩු ඉදිරියේ දී සම්පූර්ණ කර ගැනිමට කටයුතු කරගෙන යන බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

## 08.4 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සුනිල් අරංගල මැතිතුමා</u>

I. වාර්තමාන රටේ පවතින ආර්ථික පසුබෑමත් සමග ඉන්ධන ප්‍රශ්නය දැඩි බලපෑමක් එල්ල කර ඇති අතර විශේෂයෙන්ම පළාත් පාලන ආයතන වල කෙරෙන සංවර්ධන කටයුතු වලට මෙය තදින්ම බලපා ඇති අතර මොණරාගල ප්‍රදේශයේ ග්‍රාමීය මාර්ග පද්ධතිය පසුගිය වැසි සමයත් සමග දැඩි සෝදාපාලුවකට ලක්ව මේ වන විට ඉතාමත් අබලන් තත්ත්වයට පත්වී ඇති බැවින් පවතින ඉන්ධන කෝටාවත්, ඒ වගේම පනවා ඇති වියදම් පාලන සීමා කිරීමේ චක්‍රලේඛද පදනම්කර ගැනීමේදී මෙම සංවර්ධන කටයුතු කෙසේවත් විසඳා ගැනීමට නොහැකි මට්ටමක පවතින බැවින් අප පළාත් පාලන අමාත්‍යවරයාටත්, විෂය භාර අමාත්‍යවරයාටත් මේ කරුණු කාරණා පැහැදිලි කර ප්‍රාදේශීය සභාව මගින් ලිඛිතව දන්වා යැවීමට කටයුතු කර පවතින ඉන්ධන කෝටාව සංශෝධනය කර පළාත් පාලන ආයතන වල සංවර්ධන කටයුතු සඳහා විසඳුමක් ලබාදෙන ලෙසට ඉල්ලීමක් කර දන්වා යැවීමට කටයුතු කරන්න කියා ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

II. ඒ වගේම රටේ පවතින දේශපාලන අස්ථාවරත්වය සමග ගමේ ජනතාව වෙනුවෙන් පෙනී සිටින ප්‍රාදේශීය සභා මහජන නියෝජිතයින් දැඩි අසරණ තත්ත්වයකට පත්ව

සිටින අතර විශේෂයෙන්ම බල ප්‍රදේශය තුළ පවතින විවිධ ප්‍රශ්න, ගැටලු සාකච්ඡා කර විසඳුම් ලබා ගැනීමට පවතින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මේ වන විට නිසියාකාරව නොපැවැත්වීම මත ජනතාවගේ ප්‍රශ්න කතා කිරීමට නොහැකි වී ඇති බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටි අතර අද වන විට කුඹුක්කන ප්‍රදේශයේ අලි ප්‍රශ්නය උග්‍ර ලෙස ජනතාවට බලපෑම් ඇති කරන අතර ඉතාමත් දැඩි පීඩන තත්ත්වය යටතේ දුක් මහන්සි වී වගා කරන ලද බොහෝ වගාවන් අලි පැමිණ විනාශ කර දැමීම මත මෙවැනි ප්‍රශ්නවලදී වගකිය යුතු සියලුම අංශවල නිලධාරීන් නිවරදිව කටයුතු කරනවා නම් මේ රට මේ ආකාරයෙන් අරාජික නොවන බවත් කෙසේ හෝ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව නිසි පරිදි පැවැත්වීමට කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන් වෙත දන්වා යැවීමට කටයුතු කරන ලෙසත්, ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

III. ඒ වගේම ප්‍රාදේශීය සභා නිල කාලය අවසන් වෙමින් පවතින අතර පසුගිය කාලය පුරාවටම ගරු සභාපතිතුමාගේ මැදිහත් වීම තුළ මඩ වගුරක් සේ පැවති මොනරාගල නගරය අද වන විට ඉතාමත් ලස්සන පිරිසිදු නිසංසල වටපිටාවක් සමග ලස්සන වී ඇති අතර ජනතාවගේ ආකර්ෂණයට ගෞරවයට ලක් වී ඇති බවත්, ප්‍රාදේශීය සභාව මගින් විශාල සංවර්ධන වැඩකොටසක් ප්‍රදේශයට සිදුකර ඇති අතර විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවේ සියලු කටයුතු මේ වන තෙක් ඉතාමත් විනිවිදභාවයකින් යුතුවකරගෙන පැමිණි අතර විශේෂයෙන්ම ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටත් මේ සම්බන්ධයෙන් විශේෂ ස්තූතිය පුදකර සිටින බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

IV. ඒ වගේම ප්‍රාදේශීය සභා පසුගිය අයවැය වාර්තා මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් ප්‍රදේශයේ බොහෝමයක් සංවර්ධන කටයුතු සිදු කර ගැනීමට හැකි වූ අතර 2023 වර්ෂයට අදාළව සකස් කර ඇති අයවැය කෙටුම්පත ද මේ වෙන විට අප සියලුදෙනා වෙත ලබාදී ඇති බැවින් ඒ සඳහා ඉදිරි මාසයේදී සිදුකරනු ලබන ඡන්ද විමසීම් අවස්ථාවන්වලදී ගැටලු සහගත තත්ත්වයන් ඇති නොකර මේ අවස්ථාවේදීම මෙම අයවැය කෙටුම්පතේ පවතින යෝජනා හෝ සංශෝධන හෝ ගැටලු සහගත තත්ත්වයන් සම්බන්ධව සාකච්ඡා කර නිවරදි කර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමන් සඳහන් කර සිටි අතර මේ තාක් කල් ඔබ අප සියලු දෙනාම සහයෝගයෙන් ප්‍රාදේශීය සභාවේ කටයුතු පවත්වාගෙන ආ ආකාරයටම ඉදිරි කාල සීමාව තුළද නිවැරදිව සහයෝගීව කටයුතු කරමු බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

පසුගිය දිනක කොළඹ පක්ෂ ලේකම් තුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමට සහභාගී වූ අවස්ථාවේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවත්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවත් පැවැත්වීමට කඩිනමින් කටයුතු සලසා දෙන ලෙස දැනුම් දීමක් සිදු කළ බවත් ඒ වගේම ප්‍රදේශයේ අතුරු මාර්ග කැපීම සඳහා දැනට ලැබෙන ඉන්ධන ප්‍රමාණයෙන් සිදු කළ නොහැකි අතර ඉදිරි දින වලදී මේ සම්බන්ධව අදාල නිලධාරීන්

සමග සාකච්ඡා කර කඩිනමින් විසඳුමක් ලබාගැනීමට කටයුතු කරමු බවට ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම ප්‍රාදේශීය සභාවක් වශයෙන් ජනතාවට හැකි උපරිම අයුරින් සේවය කළ බවත් විශේෂයෙන්ම මේ වන විට ප්‍රාදේශීය සභාව මගින් ජනතාව වැඩි වශයෙන් ගැවසෙන ස්ථානවල කොන්ක්‍රීට් බංකු ගසා ඔවුන්ට විවේකීව පහසුව සිටීමට වැඩ කටයුතු සලසා ඇති අතර විශේෂයෙන්ම බස් නැවතුම්පළ ගඟ දිගේ කඩ කාමර ඉවත් කළ බැවින් එම ස්ථානයේ ද බංකු ටිකක් සවිකර සුවපහසු ලෙස පත්තරයක් බැලීමට ජනතාවට කුටියක් සාදා ඉඩ පහසුකම් සලසා දිය යුතු බවත්, ඒ වගේම මදුරුකැටියේත්, කුඹුක්කනත් මෙවැනි විවේක උද්‍යාන සකස් කිරීමට කටයුතු කරන බවත් ඒ වගේම බිබිල පාර සමෘද්ධි කාර්යාලය අසල බොහෝ වැඩිහිටි පිරිසක් දිගු වේලාවක් සිටගෙන පෝලිම් ගැසී සිටගෙන සිටින අතර මානුෂීය වශයෙන්ද සලකා බලා මෙම ස්ථානයේ ද බංකු ටිකක් සභාව මගින් සකස් කර දිය යුතු බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම ඉදිරි මාස කීපය තුළ ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි තුළ වැවී ඇති කැලෑවන් කපා සුද්ද කර පුළුවන් ආකාරයට වැටවල් සකස් කර නිරවුල් කර දීමට කටයුතු කරමු බවත් විශේෂයෙන්ම හුලන්දාව දකුන දොඩම් වත්ත සුසාන භූමියේ ද වැඩි වශයෙන් කැලය වැවී ඇති බැවින් එම කැලය  කපා කඩිනමින් සුද්ද පවිත්‍ර කර දීමට කටයුතු කළ යුතු බවත් සුසාන භූමි කැපීමේදී සභාවේ වාහන යොදවා ගැනීම පවතින ඉන්ධන ප්‍රශ්නයත් සමග ගැටලුවක් පවතින බැවින් කුලී පදනම මත හෝ වාහන යොදවා ගෙන මෙම සුසාන භූමි ටික සුද්ද පවිත්‍ර කිරීමට කටයුතු කරමු බවට ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම ඉදිරියේදී මහ නගර සභා ඇති කිරීමෙන් අනතුරුව ප්‍රාදේශීය සභාව පිහිටුවීම සඳහා  සියලු  ප්‍රදේශයන් වලට පහසු වන අන්දමට  හුලන්දාව හන්දියේ පවත්වාගෙන යෑමට කටයුතු කිරීම සුදුසු බැවින් ඉතාමත් සුදුසු ස්ථානයක් වශයෙන් සැම දෙනාගේම පහසුව පිණිස සුමේධා මැඩම් සිටි කාලයේදී සහයෝගීතා පදනමට ලබා දුන් ඉඩම් කැබැල්ලක් හුලන්දාව හන්දියේ පවතින අතර රජයේ ප්‍රතිපාදන වලින් එහි ඉදිකර ඇති ගොඩනැගිල්ල ද ඊට එහායින් ඇති රබර් කැල්ල ද  ප්‍රාදේශීය සභාවට යොදාගනිමු බවට ගරු සභාපතිතුමා සඳහන් කර සිටි අතර මෙය ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලෙසට අවශ්‍ය ස්ථාන වෙත ලිපි මගින් දැනුවත් කර මෙම භූමිය වෙන්කර ගැනීමට කටයුතු කරමු බවට ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

මෙම අවස්ථාවේදී ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත්  කරන ලද බල ප්‍රදේශයේ සිදු කළ යුතුම මෙම අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සියල්ලම ඒ ආකාරයෙන්ම සිදු කිරීමට කටයුතු කිරීම කඩිනමින් සිදු කිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව අනුමත කර සිටින ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

අනතුරුව සභිකවරුන්ගේ වෙනත් කරුණු තව දුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ලබන මස සභා රැස්වීම 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වන සිකුරාදා දින ප.ව.2.30 ට යොදා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් සඳහන් කර සිටි අතර සභාවේ සියළු දෙනාගේම එකඟතාවය මත එය සභා සම්මත කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි ගරු උප සභාපතිතුමන් ඇතුළුව සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.5.30 ට  අවසන් කරන ලදී.

2022.09.16 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව .........................................................................වන දින පැවැති මහ සභාවේ...............................................................................................යෝජනාවෙන් සභ...................................................................................................ස්ථිරත්වයෙන්

ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.